# Essays
# &
# Reminiscences

## A Felicitation in Honour of NTSA Senadeera
(Librarian, University of Peradeniya (1982-2002)


**Editor-in-Chief**
R Maheswaran

**Co-Editors**
Champa NK Alahakoon
Kanchana Dehigama


*1921-2021*
*Centenary Celebration*
University of Peradeniya Library

**Published in Parallel to the Inauguration of 100 year Celebration of University of Peradeniya Library on 08.04.2021**


**2021**
University of Peradeniya Library

# Content Page


| No | Preliminary Pages | Page |
|---|---|---|
| | *Message of the Vice Chancellor* | i-iii |
| | *Message of the Deputy Vice Chancellor* | iii-iv |
| | *Message of the Librarian* | v-vi |
| | *Editorial Preface* | vii-viii |
| | *List of Reviewers* | x |
| | *List of Contributors* | x-xiii |
| | *Content Page* | xiv-xvi |
| 1. | NTSA Senadeera - A Brief Biographical Sketch.<br>***Kanchana Dehigama*** | 1-4 |
| 2. | NTSA Senadeera – Bibliography.<br>***Kanchana Dehigama*** | 5-8 |
| 3. | A Leisurely Chat with Mr. N. T. S. A. Senadeera the 5th Librarian of University of Peradeniya.<br>***Champa N. K. Alahakoon*** | 9-29 |
| 4. | The Legal Deposit Legislation Relating to Printed Materials in Sri Lanka and the Fourth Collection of Legal Deposit Materials in the University of Peradeniya Library.<br>***N.T.S.A. Senadeera*** | 30-38 |


## Part I – Reminiscences


| | | |
|---|---|---|
| 5. | පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ සේනාධීර භූමිකාව.<br>***වෝල්ටර් මාරසිංහ*** | 40-48 |

6. Memories — 49-54
*Ven. Ampitiye Dhammasari*
*(Formerly Mrs.D.Ratnayake)*



## Part II – Essays


7. From Storage to dissemination: Paradigm shift on repositories of knowledge, Wisdom and Heritage. — 56-65
*Sudharshan Seneviratne*

8. Sectarianism and Teaching versus Learning in Eduation — 66-79
*J. M. Gunadasa*

9. එදා සරසවිය බැබළවූ සිංහල අධ්‍යයනාංශය. — 80-90
*කේ. එන්. ඕ. ධර්මදාස*

10. Scholarly Research Output of University of Peradeniya, Sri Lanka: Scientometric Analysis. — 91-108
*J. Arumugam, R. Balasubramani, & R. Maheshwaran*

11. Digital Information Literacy needs of the undergraduates in the online learning environment induced by COVID-19: the case of state universities in Sri Lanka. — 109-118
*Pradeepa Wijetunge*

12. Marketing Library Services : importance and types of strategies that could be adopted by libraries. — 119-133
*Shirani Ranasinghe, & A. M. S. Angammana*

13. Public Relations Practices in Higher Education Institutions in Karnataka State. — 134-144
*G. T. Mahesh*

14. An Investigation of Continuing Professional Development Practices of University Librarians in Sri Lanka. — 145-164
*Chamani Gunasekera*

15. Excellence in LIS education of SLLA: a Review of Enrolment Trends of DIPLIS Programme. 165-178
***M .N. Ravikumar***

16. Quality of Library Services and Facilities in Tamilnadu Dr Ambedkar Law University Library – Users Feedback. 179-195
***A. Bagavathi***

17. Changing Roles and Activities of Librarians with Special Reference to Health Sciences Librarians: Present-day Scenario. 196-208
***Sriyani Perera***

18. Computer Literacy Development Programme: Library Professionals' Training Series (LPTS), the Library, University of Kelaniya. 209-217
***Ven. Deiyandara Pannannda & W. W. S. Thrishala Warnasooriy***

19. නූතන පුස්තකාල හා තොරතුරු සේවා සඳහා අළෙවිකරණ උපාය මාර්ග භාවිතය : ඉගෝර් ඇන්සොෆ් ගේ නිෂ්පාදන-වෙළඳපොළ වර්ධන න්‍යාසය ඇසුරින් 218-231
***ජේ ජේ ජී ආරච්චිගේ***

20. අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණය පිළිබඳ විමර්ශනාත්මක විවරණයක් 232-246
***ආර්. ඩී. ආනන්ද තිස්ස***

21. අධ්‍යාපන කාර්යයේදී විශ්වකෝෂවල ඇති වැදගත්කම 247-262
***ආර්. ඒ. පී. සකුන්තලා සෙනෙවිරත්න***

22. ඵලදායි පුස්තකාල සේවාවක් ඉටුකිරීම සඳහා වැදගත්වන මුද්‍රිත සම්පත් ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය 263-279
***චන්දිමා වාදසිංහ***

# 21

# අධ්‍යාපන කාර්යයේදී විශ්වකෝෂවල ඇති වැදගත්කම

ආර් ඒ පී සකුන්තලා සෙනෙවිරත්න

saku@lib.ruh.ac.lk

සාරාංශය

*මිනිසාගේ මූලික අවශ්‍යතාවන් අතර වර්තමානයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ තොරතුරු අවශ්‍යතා වඩා ඉස්මතු වී තිබීමයි. විශේෂයෙන්ම වත්මන් ලෝකය තුළ අධ්‍යාපනික, සමාජයීය, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතිකමය ක්ෂේත්‍ර ඔස්සේ මානව දැනුමට එකතුවන තොරතුරු දිනෙන් දින වැඩි වෙමින් පවතී. ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් පර්යේෂණාත්මකව, ගවේශණාත්මකව සිදු කෙරෙන කටයුතු සඳහාත්, ශාස්ත්‍රීය කටයුතුවලදීත් පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා විමර්ශන මූලාශ්‍රවලින් බැහැරව කටයුතු කළ නොහැකිය. විශේෂයෙන්ම අධ්‍යාපන කාර්යයේදී විමර්ශන මූලාශ්‍ර අතර විශ්වකෝෂවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. විශ්වකෝෂයක් බොහෝ විට එක් විෂයයක් හෝ විෂය ගණනාවක තොරතුරු ආවරණය කරයි. එක් එක් විෂය විශේෂඥයන්ගේ දායකත්වය, එම තොරතුරු පෙළගස්වා ඇති ආකාරය, ඉදිරිපත් කර ඇති විලාශය වැනි ලක්ෂණ දෙස බැලීමේදී අන් මූලාශ්‍රවලට වඩා විශ්වකෝෂය පෙරමුණේ සිටී. ඒ නිසාම සෑම පුස්තකාලයකම තිබිය යුතු ප්‍රධානතම විමර්ශන මූලාශ්‍රයක් ලෙසද විශ්වකෝෂය හැඳින්විය හැකිය. විවිධ විශ්වකෝෂ වර්ග මොනවාද, විශ්වකෝෂවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ කවරේද, අධ්‍යාපන කාර්යයේදී විශ්වකෝෂවල වැදගත්කම යනාදිය පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරේ.*

ප්‍රමුඛ පද : *අධ්‍යාපනය, තොරතුරු මූලාශ්‍ර, පුස්තකාලය, විමර්ශන මූලාශ්‍ර, විශ්වකෝෂ, විෂය විශ්වකෝෂ*

## හැඳින්වීම

මිනිස් ජීවිතයේ වැදගත්ම අවශ්‍යතා අතර අධ්‍යාපනය ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකේ. උපතේ සිට මරණය දක්වා ජීවිත කාලය මුළුල්ලේම සෑම පුද්ගලයකුම යම්කිසි දෙයක් ඉගෙන ගනිමින් සිටී. පාසැලින්, වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින්, නිවස තුළින්, සමාජය තුළින්, තමා ජීවත්වන වටපිටාව තුළින් යනාදී වශයෙන් ගත් විට මිනිසා නිරන්තර දැනුමින් යාවත් කාලීන වෙමින් සිටින බව අප සැම දන්නා කරුණක් වේ.

විශේෂයෙන්ම ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඔබ්බට ගොස් ද්විතීක අධ්‍යාපනයේදී හෝ තෘතීයික අධ්‍යාපනයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතු සඳහාත්, ඉන් ඔබ්බට

පර්යේෂණාත්මකව කරනු ලබන ශාස්ත්‍රීය කටයුතු සඳහාත් තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන මෙවලමක් ලෙස ග්‍රන්ථ ප්‍රධාන දැනුම් මාධ්‍යයක් ලෙස හැඳින්විය හැකිය.

පොතක අන්තර්ගත කොට ඇති තොරතුරු, එය පෙළ ගස්වා ඇති ආකාරය, ඉදිරිපත් කර ඇති විලාසය යනාදී කරුණු පදනම් කොට ගෙන යම් ග්‍රන්ථයක් ප්‍රධාන වර්ග 3 කට බෙදා දැක්විය හැකිය. එනම්,

- ශාස්ත්‍රීය කෘති
- නිර්මාණ කෘති
- විමර්ශන කෘති වේ.

විවිධ විෂයන් පදනම් කර ගනිමින් අධ්‍යාපන කාර්යය සඳහා රචනා කරන ලද පාඨ ග්‍රන්ථ, පෙළ පොත්, පර්යේෂණ කෘති ආදිය ශාස්ත්‍රීය ග්‍රන්ථ ලෙස හැඳින්විය හැකිය.

පාඨකයාගේ රසාස්වාදය හා වින්දනය අරමුණු කර ගනිමින් බිහි වූ කෘති නිර්මාණ කෘති වේ. නවකතා, කෙටිකතා, පද්‍ය, නාට්‍ය වැනි නිර්මාණ කෘති මෙයට උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය. මේවා මුල සිට අග දක්වා අනුපිළිවෙලින් කියවා වින්දනයක් ලබා ගත යුතු කෘති විශේෂයකි. සාහිත්‍යමය වටිනාකමක් ඇති මෙම ග්‍රන්ථ තුළින් පාඨකයාගේ පරිඥානය වර්ධනය කෙරේ.

විමර්ශන ග්‍රන්ථ යනුවෙන් හැඳින්වෙන්නේ යම් නියත තොරතුරක් උපුටා ගනු පිණිස පරිශීලනය කරනු ලබන ග්‍රන්ථ විශේෂයකි. අවශ්‍ය තොරතුර ක්ෂණිකව උද්ධරණය කර ගැනීමේ හැකියාව මෙම විමර්ශන ග්‍රන්ථවල දැකිය හැකි විශේෂත්වයකි. යම් වින්දනයක් උදෙසා එක දිගටම නොකියවිය යුතු සුවිශේෂී තොරතුක් දැන ගැනීම සඳහා පමණක් භාවිත කළ යුතු ග්‍රන්ථ විශේෂයකි. විමර්ශන ග්‍රන්ථ හෝ කෘති කිසිම හේතුවක් නිසා පුස්තකාලයෙන් බැහැර නොදෙන අතර පුස්තකාලය තුළදීම පමණක් පරිශීලනය කළ යුතු ග්‍රන්ථ විශේෂයකි. (ALA Glossary of Library & Information Science, 1983, 188p.) ශබ්දකෝෂ, විශ්වකෝෂ, තොරතුරු සංග්‍රහ, වාර්ෂික ග්‍රන්ථ, අනුක්‍රමණිකා, සාර සංග්‍රහ, ග්‍රන්ථ නාමාවලී, අත්පොත්, නාමාවලී, මාලික ප්‍රකාශන යනාදිය උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

මෙම විවිධ වර්ගයේ විමර්ශන කෘතීන් අතර විශ්වකෝෂයක විශේෂත්වයත්, අධ්‍යාපන කාර්යයයේදී එය වැදගත් වන අකාරයත් පිළිබඳ ගෙන හැර දැක්වීම මෙම ලිපියෙන් සිදු කෙරේ.

**විශ්වකෝෂයක් යනු කමක්දැයි හැදින්වීම**

කෝෂ ග්‍රන්ථ අතර ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකෙන ග්‍රන්ථ විශේෂයක් ලෙස විශ්වකෝෂ හැඳින්විය හැකිය. යම් යම් විෂයන් පිළිබඳ තොරතුරු අකාරාදී පිළිවෙලට ක්‍රමානුකූලව සංවිධානය කර ඇති ග්‍රන්ථයක් හෝ ග්‍රන්ථ කාණ්ඩ කිහිපයක් ලෙස විශ්වකෝෂය හැඳින්විය හැකිය. සමස්ත මානව දැනුම කිසියම් අයුරකින් සංවිධානය කොට වාර්තා ගතකිරීම විශ්වකෝෂයක මුඛ්‍ය පරමාර්ථය වේ. (Kumar, 1987, 158p.) විශ්වකෝෂය යනු එක්තරා විෂයකින් හෝ ක්ෂේත්‍රයකින් හෝ අදාළ සියලුම අංගයන්ගෙන් ලබා ගත් දැනුමෙහි සාරාංශ ගෙන හැර දක්වන සංක්ෂේපයක් හෝ විමර්ශන ග්‍රන්ථයක් වේ. විශ්වකෝෂ අන්තර්ගතයන් බොහෝ විට ලිපියෙහි නම හෝ තේමාවේ ස්වභාවය අනුව අකාරාදී පිළිවෙලකට සකස් කර ඇති ලිපි හෝ සටහන් ලෙස බෙදා දක්වා ඇත. ශබ්දකෝෂ හා සාපේක්ෂව ගත් කල විශ්වකෝෂයන්හි සටහන් දිගින් වැඩි වන අතර සවිස්තරාත්මක බවින් ද ඉහළ මට්ටමක පවතී. ශබ්දකෝෂය මූලිකත්වය දෙනු ලබන්නේ ශබ්ද නිෂ්පත්තිය, තේරුම, උච්ඡාරණය, භාවිතය හා ව්‍යාකරණ විධි ආදිය අඩංගු වාග් විද්‍යාත්මක තොරතුරුවලට වන අතර විශ්වකෝෂයක එම ලිපිවල මාතෘකාවලට අදාළ වස්තු බීජය හා සම්බන්ධ කරුණු ගෙන හැර දක්වයි. විශ්ව කෝෂයක් යන්න නිර්වචනාත්මකව මෙලෙස පෙන්වා දිය හැක.

Encyclopaedia of Information and Library Science සහ Harrold's Librarian Glossary හි විශ්වකෝෂය යන්න නිර්වචනය කර ඇත්තේ මෙසේය.

> "A work containing information an all subjects, or limited to a special field or subject, arranged in systematic, (usually alphabetical), order. encyclopaedias may be in one volume, in which case very brief information will be given, or they may be in forty or more volumes in which the various matters will be comprehensive, usually written by expert, and sometimes containing bibliographies and illustrations." (Encyclopaedia of Information and Library Science, 1993, 1053P.)

ක්‍රමානුකූලව (බොහෝවිට අකාරාදි පිළිවෙලට) සකසන ලද සියලුම විෂයන් හෝ එක් විශේෂිත ක්ෂේත්‍රයක් හෝ විෂයයක් සම්බන්ධ තොරතුරු සහිත කෘතියකි. විශ්වකෝෂයක් කෙටි තොරතුරු ලබා දෙන එක් වෙළුමක් ලෙසද එසේත් නැත්නම් විද්වතුන් විසින් ලියන ලද, විස්තරාත්මක, සමහර අවස්ථාවලදී ග්‍රන්ථ නාමාවලී සහ නිදර්ශන පවා අඩංගු කල වෙළුම් 40 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලෙසද තිබිය හැකිය.

The Cambridge Encyclopedia of Language නම් වූ මාර්ගගත විශ්වකෝෂයෙහි එය අර්ථ නිරූපණය කර ඇත්තේ මෙසේය.

> "A book or set of books containing many articles arranged in alphabetical order that deal either with the whole of human knowledge or with a particular part of it, or a similar set of articles on the internet" (The Cambridge Encyclopedia of Language, 2020, para.1)

සම්පූර්ණ මිනිස් දැනුම හෝ එයින් විශේෂ කොටසක් හා සම්බන්ධ අකාරාදී පිළිවෙලකට සකස් කරන ලද ලිපි විශාල ප්‍රමාණයක් අඩංගු ග්‍රන්ථයක් හෝ ග්‍රන්ථ කට්ටලයක් හෝ අන්තර්ජාල ගත කර ඇති ඊට සමාන ලිපි කට්ටලයක් විශ්වකෝෂය යන්න අර්ථ දක්වා තිබේ.

**විශ්වකෝෂ වර්ග**

එක් එක් විශ්වකෝෂයන්හි අන්තර්ගත හා පෙළගස්වා ඇති කරුණු අනුවත්, අධ්‍යයනයේ පහසුව සඳහාත් විශ්වකෝෂ වර්ග විවිධ ආකාරයෙන් දැකිය හැකිය. ඒවා ප්‍රධාන වශයෙන් කොටස් 2 කට බෙදා දැක්විය හැකිය.

- ❖ පොදු විශ්වකෝෂ (සාමාන්‍ය විශ්වකෝෂ)
- ❖ විෂය විශ්වකෝෂ

**පොදු විශ්වකෝෂ**

සියලුම විෂය ක්ෂේත්‍රයන් හා සම්බන්ධ දැනුම සාරාංශ කර කාණ්ඩ කිහිපයකින් යුත් ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති කෘති පොදු විශ්වකෝෂ ලෙස හඳුන්වනු ලැබේ. විවිධ රටවල්, විවිධ ආයතන, විවිධ විෂයන්, ප්‍රසිද්ධ පුද්ගලයන් වැනි එක් එක් මාතෘකා යටතේ තොරතුරු ඇතුලත් ලිපි මෙම විශ්වකෝෂ ග්‍රන්ථවල ඇතුලත් වේ. එහිදී විද්‍යා, සමාජයීය විද්‍යා, මානව ශාස්ත්‍ර, සාහිත්‍ය කලා යන සියලුම විෂයයන් හා සම්බන්ධ විශ්ව දැනුම් සම්භාරය ආවරණය කර ඇත. සාමාන්‍ය විශ්වකෝෂ ග්‍රන්ථයක විෂයන් දහස් ගණනක් ආවරණය වන පරිදි දැනුම් සම්භාරය ලිපි මඟින් ඉදිරිපත් කිරීමේදී එක් විෂයක් හඳුන්වා දීම සඳහා පිටු සිය ගණනක් දිග ලිපි ද ඉදිරිපත් කර ඇත. මෙම විශ්වකෝෂ ග්‍රන්ථවල තොරතුරු ඇතුලත් ලිපි අකාරාදී පිළිවෙලට පෙළ ගස්වා ඇති අතර එමගින් පාඨකයාට පහසුවෙන් තොරතුරු වෙත ප්‍රවේශ වීමට මඟ සලසා ඇත. ඉතා ප්‍රසිද්ධ පොදු විශ්වකෝෂ ගණනාවක් දක්නට ඇති අතර මේවා කාණ්ඩ 30 සිට 50 පමණ දක්වා විශාල ප්‍රමාණයකින් දැකිය හැකිවේ. පොදු විශ්වකෝෂ සඳහා උදාහරණ කිහිපයක් මෙලෙස දැක්විය හැකිය.

- Encyclopedia Britannica
- Encylopedia Americana
- Encyclopedia Asiatica

- Encyclopedia Indica
- සිංහල විශ්වකෝෂය

සාමාන්‍ය හෙවත් පොදු විශ්වකෝෂ අතර ලොව ප්‍රසිද්ධම විශ්වකෝෂ කිහිපයක එහි වැදගත්කම පිළිබඳ තොරතුරු විමසා බලමු.

**බ්‍රිතාන්‍ය විශ්වකෝෂය (Encyclopedia Britannica)**

පොදු විශ්වකෝෂ අතර බ්‍රිටැනිකා විශ්වකෝෂය (Encyclopedia Britannica) ලොව ඉතා ප්‍රසිද්ධ විශ්වකෝෂයක් ලෙස හැඳින්විය හැකිය. වර්තමාන විශ්වකෝෂ අතර මුදුන් මල්කඩක් සේ සලකන බ්‍රිටැනිකා විශ්වකෝෂයෙහි විශේෂත්වය වන්නේ සෑම විෂය පරාසයකම දැනුම් සම්භාරයන් ඇතුලත්, ඉංග්‍රීසි භාෂාවෙන් රචිත ග්‍රන්ථ අතර විශිෂ්ඨ වූත්, ශාස්ත්‍රීය වූත් ග්‍රන්ථයක් ලෙසයි.

1768 දී වෙළුම් 3 කින් සමන්විතව මෙහි පළමු සංස්කරණය පළ වූ අතර දැනට අවසාන මුද්‍රිත සංස්කරණය 2010 දී සිදු වී ඇත. ඒ 15 වන සංස්කරණය යි. මෙම සංස්කරණයෙහි ග්‍රන්ථ වෙළුම් ගණන 32 ක් වන අතර මුද්‍රිත පිටු 32000 කට අධික ප්‍රමාණයකින් සමන්විත වේ. මෙය අවසාන මුද්‍රිත සංස්කරණය වේ. මෙහි ඇතුලත් ලිපි ලිවීම සඳහා කතුවරුන් 4000 කට අධික ප්‍රමාණයක් දායකත්වය සපයා තිබීම ද විශේෂත්වයකි. විවිධ මාතෘකා යටතේ මෙයට ලිපි සපයා ඇත්තේ ලොව පුරා සිටින විශ්ව කීර්තියට පත් පුද්ගලයන් විසිනි. එම නිසා මෙහි ඇතුලත් දැනුම් හා තොරතුරුවල ඇති සාධිකාරීත්වය පිළිබඳ උසස් මට්ටමේ පිළිගැනීමක් තිබේ. එසේම මෙම විශ්වකෝෂයෙහි අන්තර්ගත තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් දෙආකාරයකින් කටයුතු කරනු ලබයි. එනම් නිරන්තරයෙන් සිදු කරන සංශෝධන හා වාර්ෂිකව සිදු කරන සංශෝධන ලෙසිනි.

15 වන සංස්කරණයේ ආකෘතිය කොටස් 3 කින් යුක්ත වේ. ඒ Propaedia, Micropaedia, Macropaedia, යන කොටස් තුනෙනි. Propaedia යන කොටසින් සමස්ත මානව දැනුමේ සංක්ෂිප්ත විස්තරයක් දක්වා ඇත. විෂයයක සන්දර්භය අවබෝධ කර ගනිමින් සවිස්තරාත්මක ලිපි සොයා ගැනීමට පාඨකයාට උපදෙස් දී ඇත. Micropaedia කොටස වෙළුම් 12 කින් යුක්ත අතර සාමාන්‍යයෙන් වචන 750 කට අඩු කෙටි ලිපි මෙහි ඇතුලත් වේ. පාඨකයකුට මෙම කොටසින් ඉක්මනින් කරුණු පරීක්ෂා කර ගත හැකි අතර විස්තරාත්මක කොටස ලෙස සැලකෙන Macropaedia සඳහා මඟ පෙන්වීමක් සිදු කරයි. ඒ අනුව මෙම විශ්ව කෝෂයෙහි ප්‍රධානතම කොටස Macropaedia වේ. මෙහි දිගු ලිපි හා සටහන් ඇතුලත් කර ඇත. පිටු 2 ක සිට පිටු 310 දක්වා අතර ප්‍රමාණයක් එක් එක් ලිපි සඳහා ඉඩ වෙන් කොට ඇත. වෙළුම් 17 කින් යුක්ත මෙම කොටසෙහි ඉතා වැදගත් සිදුවීම් හා නව ප්‍රවණතා පිළිබඳ ඇතුලත් ලිපි බොහොමයක් දැකිය හැක.

වර්තමානය වන විට සංගත තැටි (Optical Disc) මාර්ගගත (Online), ජංගම පිටපත් (Mobile version) යන නව ක්‍රමවේද හරහා මෙම විශ්වකෝෂය මඟින් තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සපයා ඇත. බ්‍රිටැනිකාහි ඇති තොරතුරු ලිපි ලක්ෂයකට අධික ප්‍රමාණයක් මෙම DVDවල තැන්පත් කර ඇත. එසේම මෙම කෝෂ ග්‍රන්ථයෙහි ඇති තොරතුරුවලට ප්‍රවේශවීම සඳහා මාර්ගගත පහසුකම් ලබා දී ඇති අතර ඒ ඔස්සේ යාවත්කාලීනව පවත්වා ගෙන යන ලිපි ලක්ෂ 120ක ප්‍රමාණයකට ප්‍රවේශ පහසුකම් ලබා දී තිබේ. එපමණක් නොව ජංගම දුරකතන හරහාද මෙහි ඇති තොරතුරු පරිශීලනයට ඉඩ සලසා දී තිබේ. ඉතා ගැඹුරින් අධ්‍යයන කටයුතුවල යෙදෙන්නන් සඳහා මෙම විශ්වකෝෂය ඉතා වැදගත් වේ. එසේම මෙහි ඇති සමහර ලිපි මුද්‍රිත ග්‍රන්ථ මෙන් දීර්ඝය. නමුත් පාඨකයාගේ පරිශීලනයේ පහසුව සඳහා ඒවා අනු මාතෘකාවලට වෙන්කොට එම අනු කොටස්වල මාතෘකා හා පිටු අංකය එක් කොට සැකසූ පටුනක් ලිපිය ආරම්භයේ සඳහන් කොට තිබීම විශේෂත්වයකි. (රූපසටහන් අංක 1 බලන්න)

---


General characteristics of teaching 422
- The status of teachers 422
  - The economic status
  - Social and occupational status
  - Geographic mobility of teachers
  - Stereotype of the teacher
  - Building the profession in a new country
- Functions and roles of teachers 425
  - Role in curricular design
  - The doctrine of *in loco parentis*
  - Extramural activities of teachers
  - Scholarship and the profession
- The career of the teacher 427
  - The professionalization of teaching
  - Educational associations and teachers' unions
- The teaching profession and contemporary social revolutions 428

Teacher education 428
- The evolution of teacher education 429
  - Early development
  - Late 19th- and early 20th-century developments
  - Organization of teacher education in the 20th century
- Issues and problems in teacher education 432
  - General education
  - The study of educational principles
  - Practical training
- Appointment procedures and probationary requirements 433
- In-service training 433
- Future developments in teacher education 434

Teaching methods 434
- The teacher and the learner 434
  - General objectives of teaching
  - The general design of instruction
- The organization of instruction 436
- Instructional media 436
  - Speaking-listening media
  - Visual and observational media
  - Reading-writing media
  - Computer-based instruction

Teaching theories: educational psychology 437
  - Traditional theories
  - Conditioning and behaviourist theories
  - Cognitive theories
  - Structural theories

Bibliography 439


---

රූපසටහන. අංක 1

මූලාශ්‍රය : බ්‍රිටැනිකා විශ්වකෝෂය, වෙළුම 28, පිටුව.422

තොරතුරු ඉදිරිපත් කිරීමේදී එක් විෂයකට අදාළ එක් එක් ලිපි අනුමාතෘකාවලට පාඨකයාට අවශ්‍ය තොරතුරුවලට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අනුක්‍රමණිකාවක්ද දක්වා තිබීම විශේෂත්වයකි.

## ඇමරිකානු විශ්වකෝෂය (Encyclopeadia Americana)

1829 දී ඇමරිකා එක්සත් ජනපදයේදී ආරම්භ කරන ලද ඇමරිකානු විශ්වකෝෂය සාමාන්‍යය විශ්වකෝෂ අතර ප්‍රමුඛස්ථානයක් ගනී. වෙළුම් 30 කින් සමන්විත මෙම විශ්වකෝෂය තුළ අඩංගු ලිපි සංඛ්‍යාව 45000 ඉක්මවයි. විවිධ විෂයයන් යටතේ ලියන ලද ලිපි රැසක් මෙහි ඇතුලත්ය. විවිධ පුද්ගලයන්, සාහිත්‍ය, කලාව, සිනමාව සම්බන්ධයෙන් අදාළ තොරතුරු ඇතුලත් විචාර ලිපිද මෙහි අඩංගු වේ. සමහර ලිපි ඉතා දීර්ඝ වශයෙන් ලියා ඇති අතර පාඨකයාගේ පරිශීලනයේ පහසුව තකා ඒවා අනු මාතෘකාවලට වෙන්කොට එම අනු කොටස්වල පටුනද ලිපිය ආරම්භයේ සඳහන් කොට තිබීම විශේෂත්වයකි. මෙහි සඳහන් ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධයෙන් ලියා ඇති ලිපිය වචන 300000 ඉක්මවා ඇත. මෙහි ලිපි ලිවීම සඳහා ඒ ඒ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 6500 ක් පමණ වූ ප්‍රවීන කර්තෘ මණ්ඩලයකගේ දායකත්වය ලබා ඇත. මෙම විශ්වකෝෂයෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ විෂය සම්බන්ධතාවක් දැක්වීම සඳහා ලිපි අතර හරස් යොමු එක් ලක්ෂ පනස්දහසක් පමණ භාවිත කර තිබීමයි. තවද 1200 ක් ඉක්මවූ සිතියම්, කලු-සුදු රේඛා චිත්‍ර හා වර්ණ රූප 4500 කට ආසන්න ප්‍රමාණයක්ද, 1000 ක් ඉක්මවූ වගු, ග්‍රන්ථ නාමාවලී 9000 කට අධික ප්‍රමාණයක් ද මෙහි අන්තර්ගතය.

මෙම විශ්වකෝෂය සංයුක්ත තැටියක් ලෙස මුලින්ම නිකුත් කරන ලද්දේ 1995 දීය. ඇමරිකානු විශ්වකෝෂයෙහි මාර්ගගත ප්‍රවේශය ප්‍රථම වරට හඳුන්වා දෙනු ලැබූයේ 1997දී වන අතර අද එය සෑම පාඨකයකුගේම තොරතුරු අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමට අත්වැලක් සපයන්නා වූ විමර්ශන මූලාශ්‍රයක් ලෙස පෙන්වා දිය හැකිය.

## ඉන්දියානු විශ්වකෝෂය (Encyclopedia Indica)

මෙම විෂය විශ්වකෝෂය ඉන්දියාව පිළිබඳව තොරතුරු ගවේෂණය කරන්නෙකු සඳහා ඉතාම ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් වේ. විශේෂයෙන්ම ඉන්දියානු ඉතිහාසය පිළිබඳ වෙනත් කිසිදු කෘතියකින් සොයා ගත නොහැකි අන්දමේ තොරතුරු ප්‍රමාණයක් මෙම විශ්වකෝෂය තුළින් ලබා දී ඇත. ඉන්දියානු ඉතිහාසය, සංස්කෘතිය, දර්ශනය, ආගම, ගෘහ නිර්මාණ ශිල්පය, කලාව, සාහිත්‍යය, විද්‍යා ආදී සියලු ක්ෂේත්‍රයන් ආවරණය කර තිබීම මෙහි ඇති විශේෂත්වයකි.

ඉන්දියාව යනු ලොව පැරණිතම ශිෂ්ටාචාරවලින් එකකි. සමාජීය, ආර්ථික, ආගමික හා දේශපාලනිකමය වශයෙන් විවිධ යුගයන්, ඒ ඒ කාල වකවානුවල සුවිශේෂී සිදුවීම් ආදිය අන්තර්ගත කර තිබීමද දැකිය හැකිය. සමස්ථ ඉන්දියානු ඉතිහාසය කාල වකවානු හතරකින් වෙන් කොට තොරතුරු පෙළ ගස්වා ඇත. පුරාණ ඉන්දියාව (3000BC සිට 1000AD දක්වා), මධ්‍යකාලීන ඉන්දියාව (1000AD සිට 1756AD දක්වා), පූර්ව අද්‍යතන (1757AD සිට 1947AD දක්වාත්), පශ්චාත් අද්‍යතන (1947 සිට වර්තමානය දක්වා) යන කාලවකවානු ඔස්සේ තොරතුරු පෙලගස්වා

තිබීම මෙහි ඇති විශේෂත්වයකි. මෙම විශ්වකෝෂයෙහි තවත් විශේෂත්වයක් වන්නේ අන්තර්ගත තොරතුරු පාඨකයාට නිවරදිම අයුරින් ලබා දීම සඳහා අවශ්‍යය තැන්හිදී ඒ ඒ මාතෘකාවලට අදාළ තොරතුරු ඡායාරූප හා චිත්‍ර මාධ්‍යයෙන් ඉදිරිපත් කර තිබීමයි. මෙම සමස්ත ඉන්දියානු වංශකතාව පිළිබඳ විශ්වකෝෂය වෙළුම් 200 ක් ඔස්සේ පෙළගස්වා තිබීමද සුවිශේෂී වේ.

**සිංහල විශ්වකෝෂය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන සිංහල විශ්වකෝෂයෙහි ආරම්භය 1955 දක්වා දිවයයි. එවකට එහි ආරම්භක කතුවරයා වූයේ මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතායි. ඔහුගෙන් පසු ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංග, මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස, මහාචාර්ය මැන්දිස් රෝහණධීර වැනි විද්වතුන් මෙහි ප්‍රධාන කර්තෘ ධූරය හෙබවූහ. වර්තමානයෙහි එනම් 2016 සිට මේ දක්වා මෙම විශ්වකෝෂයෙහි කර්තෘත්වය දරනුයේ කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා විසිනි.

සිංහල විශ්වකෝෂය නිර්මාණයේ මුඛ්‍ය අරමුණ වන්නේ විද්වතුන් අතර පමණක් නොව සාමාන්‍ය ජනයා අතර පවා නූතන විද්‍යා දැනුම පැතිරවීමයි. තවද ලංකාව පිළිබඳව විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරන තොරතුරු පහසුවෙන් සොයා පරිශීලනය කළ හැකි අයුරින් පෙළගැස්වීමද මෙහි අරමුණු අතර වේ. එමෙන්ම ලෝකයේ වෙනත් කිසිදු විශ්වකෝෂයක දැකිය නොහැකි ප්‍රතිපත්තියක් සිංහල විශ්වකෝෂය අනුගමනය කරන බව ඔවුන් පෙන්වා දෙයි. එනම් මෙහි පළවන ලිපිවලින් අඩක් ලංකාවේ තොරතුරු වෙනුවෙන් වෙන් කෙරෙන අතර ඉතිරිය නවීන විද්‍යා දැනුම වෙනුවෙන් වෙන් කිරීමයි.

මෙහි ලිපි සම්පාදනය සඳහා අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මනා පරිචයක් සහිත විද්වතුන් සම්බන්ධ වී ඇත. ලංකාවට අදාළ තොරතුරුවලට විශේෂ අවධානය යොමු කරමින් ඉතිහාසය, පුරාවිද්‍යාව, බුදුදහම, සංස්කෘතිය, සාහිත්‍යය, නීතිය, වාණිජ්‍ය, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, භූගෝලය, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව ආදී විෂයයන් කෙරෙහි තොරතුරු අන්තර්ගත කොට ඇත. සිංහල අකාරාදිය අනුව කරුණු පෙළ ගස්වා ඇති අතර අවශ්‍යය අවස්ථාවන්හිදී තොරතුරු විස්තරාත්මකව ඉදිරිපත් කිරීම සඳහා ඡායාරූප, කළු සුදු හා වර්ණ චිත්‍ර, සටහන් යොදා ගෙන ඇත. ලිපිය අවසානයේ එය රචනා කරන ලද කතුවරයාගේ නම සඳහන් කර ඇති අතර විෂය ශීර්ෂයන් තද කළු අකුරින් දක්වා ඇත්තේ පාඨකයාගේ භාවිතය පහසුව සඳහාය.

තවද විශ්වකෝෂයෙහි පළවන ලිපිවල අඩංගු කරුණුවලට අමතරව වැඩිදුර විස්තර අවශ්‍යය වූවන්ට ප්‍රයෝජනවත් විය හැකි පොත්පත් පිළිබඳ විස්තර ඇතැම් ලිපිවල අවසානයේ සඳහන් කොට ඇත. සමාන ශීර්ෂපාඨ ඇති අවස්ථාවන්හිදී 1,2,3 යනාදී වශයෙන් අංක යොදා තිබීමෙන් පාඨකයාට තොරතුරු ගවේශණයේ පහසුව ලබා දී ඇත. සෑම කාණ්ඩයකම සංකේත සූචියක් (හැකුළුම් පද) හා

අනුක්‍රමණිකාවක් දක්වා තිබීමෙන් අවශ්‍යය තොරතුර වෙත ඉක්මන් ප්‍රවේශය ලබා දී ඇත.

**විෂය විශ්වකෝෂ**

එක් විෂයක් හෝ ඊට සමගාමී විෂයන් කිහිපයක තොරතුරු ඇතුලත් ග්‍රන්ථයක් ලෙස විෂය විශ්වකෝෂ හැඳින්විය හැකිය. එහි සැකැස්ම සාමාන්‍ය විශ්වකෝෂයකට සමාන වේ. මෙම කෝෂ වර්ග දෙක වෙනස් වන්නේ සාමාන්‍ය විශ්වකෝෂයක පොදු මාතෘකා සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් වන අතර විෂය විශ්වකෝෂයක යම් විෂයක් පදනම්ව තොරතුරු ගොනු කර තිබීමයි. විෂය විශ්වකෝෂවල අන්තර්ගත වන්නේ ප්‍රස්තුත විෂය හා ඊට තදින් සම්බන්ධ විෂයන්ට අදාළ තොරතුරු පමණක් වීම මෙහි ඇති විශේෂත්වයයි.

විෂය විශ්වකෝෂයක අන්තර්ගත ලිපි ද අකාරාදී අනුපිළිවෙල අනුව ගොනු කර ඇති අතර අනුක්‍රමණිකාව භාවිතා කිරීමෙන් පාඨකයාට පහසුවෙන් තොරතුරු ලබා ගත හැකි පරිදි සකස් කර තිබේ. විෂය විශ්වකෝෂ ග්‍රන්ථවල විෂය ක්ෂේත්‍රය එක් විෂයයකට හෝ විෂයන් කිහිපයකට සීමා වුවද එම විෂය පිළිබඳ පුළුල් දැනුමක් ලබා දෙන පරිදි විෂය මාතෘකා යටතේ ලිපි සකස් වී තිබේ. සෑම විෂයක් සඳහාම විෂය විශ්වකෝෂ ප්‍රකාශයට පත් කළ හැකි අතර දැනටමත් බොහොමයක් විෂයයන් ආවරණය කරමින් විෂය විශ්වකෝෂ බිහි වී තිබෙනු දැකිය හැකිය. උදාහරණ ලෙස,

- Encyclopaedia of Social Science
- International Encyclopaedia of Science and Technology
- Encyclopaedia of Religion
- Encyclopaedia of Information and Library Science
- Encyclopaedia of Psychology
- Encyclopaedia of Management
- Encyclopaedia of Geography
- Encyclopaedia of Sports Science
- Encyclopaedia of Sociology
- Encyclopaedia of Water Science
- International Encyclopaedia of Buddhism
- The Encyclopaedia of Visual Arts
- Encyclopaedia of Biodiversity
- Encyclopaedia of Environmental Science
- කුරුලු විශ්වකෝෂය
- සිංහල භාෂාව හා සංස්කෘතිය පිළිබඳ විශ්වකෝෂය

- ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති කලා විශ්වකෝෂය
- සිංහල දේශික විශ්වකෝෂය

ඒ ඒ විෂයන් සඳහා සකස් කර ඇති විෂය විශ්වකෝෂ අතරින් කිහිපයක එහි වැදගත්කම පිළිබඳ තොරතුරු විමසා බලමු.

**පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ විශ්වකෝෂය (Encyclopeadia of Library & Information Science)**

Marcia J. Bates විසින් ප්‍රධාන සංස්කාරකත්වය දරණ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ විශ්වකෝෂයෙහි පුස්තකාල විද්‍යාව පිළිබඳ සියළුම විෂය කරුණු ආවරණය කර ඇත. පාසැල් පුස්තකාල, මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, ජාතික පුස්තකාල යනාදී පුස්තකාල වර්ග පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අන්තර්ගත කොට ඇත. එපමණක් නොව පුස්තකාල ඉතිහාසය, පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සේවා, පුස්තකාල කලමනාකරණය, අලෙවිකරණය, සංරක්ෂණය හා ආරක්ෂණය, තොරතුරු සාක්ෂරතාවය, පුස්තකාල ස්වයංකියකරණය, දැනුම කළමනාකරණය ආදි පුස්තකාල විද්‍යාවේ පුළුල් විෂය මාතෘකා මෙහි ආවරණය කොට ඇත. සමහර විෂය මාතෘකා සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා දීර්ඝ ලිපි ඇතුලත් කොට ඇත. එක් එක් විෂය කරුණු ආවරණය කිරීම සඳහා ඒ ඒ විෂය ක්ෂේත්‍රය සම්බන්ධව ප්‍රවීන කතෘ මණ්ඩලයක් විසින් ලිපි සම්පාදනය කොට ඇත. අවසානයේ දක්වා ඇති අනුක්‍රමණිකාව මගින් අවශ්‍යය තොරතුරු වෙත ක්ෂණිකව යොමු කිරීමක් සිදු කරයි.

**සමාජීය විද්‍යා විශ්වකෝෂය (Encyclopedia of Social Science)**

සමාජීය විද්‍යා යන පුළුල් විෂය ක්ෂේත්‍රය ආවරණය කරමින් මෙම විෂය විශ්වකෝෂය ප්‍රකාශයට පත් කර ඇත. මෙමගින් ඊට සමගාමී අනු විෂයන් වන දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, නීතිය යන විෂයයන් ආවරණය කර තිබෙනු දැකිය හැකිය. මෙම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලෙන පුද්ගලයන්ට ඉතාම ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් ලෙස නම් කළ හැකිය. පාඨකයාට අවශ්‍ය විෂය පිළිබඳ සමස්ථ අවබෝධාත්මක විස්තරයක් මෙතුළින් ලබා ගැනීමට හැකි වීම මෙම විෂය විශ්වකෝෂ ග්‍රන්ථවල දැකිය හැකි විශේෂත්වයකි.

**ආගම පිළිබඳ විශ්වකෝෂය (Encyclopeadia of Religion)**

ලින්ඩ්සේ ජොන්ස් (Lindsay Jones) විසින් ප්‍රධාන සංස්කාරතක්වය ගෙන සම්පාදනය කොට ඇති ආගම පිළිබඳ විශ්වකෝෂය ද ඉතා වැදගත් විමර්ශන මූලාශ්‍රයක් ලෙස පෙන්වා දිය හැකිය. 1987 දී පළමු සංස්කරණය ප්‍රකාශයට පත් කොට ඇති මෙහි විවිධ රටවල්වල ජාතීන්, ලොව අදහන ආගම් හා බැදි

සංස්කෘතිය මෙන්ම ඊට සමගාමී විෂය කරුණු සම්බන්ධව දීර්ඝ ලිපි පළ කොට ඇත. ඇමරිකාව, යුරෝපය, අප්‍රිකාව, චීනය, ජපානය, ඊජිප්තුව, ඕස්ට්‍රේලියාව, මැදපෙරදිග, ආසියාව, දකුණු ආසියාව වැනි කලාපයන්හි අදහන ආගම් සම්බන්ධව එනම් ඉස්ලාම් ධර්මය, කිස්තියානි ධර්මය, රෝමානු කතෝලික, බුද්ධාගම වැනි ක්ෂේත්‍රයන් මෙන්ම ඒවායෙහි පූජා කර්ම, වත්පිළිවෙත් විධි, බලිකර්ම පූජා, යෝගී භාවනාවන්, පූජනීය අවස්ථාවන් ආදී මාතෘකා කෙරෙහි අවධානය යොමු කොට ඇත. මෙහි සමහර මාතෘකා යටතේ උප මාතෘකා යොදමින් අවශ්‍යය අවස්ථාවන්හිදී ඡායාරූප, චිත්‍ර ආදිය මඟින්ද තොරතුරු ඉදිරිපත් කර ඇත. අවසාන වෙළුම උපග්‍රන්ථ, සංක්ෂිප්ත සටහන් හා අනුක්‍රමණිකාවකින් සමන්විත වේ.

### කුරුලු විශ්වකෝෂය

සිංහල භාෂාවෙන් රචිත විෂය විශ්වකෝෂ ඉතාම විරල අවස්ථාවක මංජුල විජේසුන්දර විසින් සම්පාදනය කොට සූරිය ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කොට ඇති කුරුලු විශ්වකෝෂය පක්ෂීන් පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට ඉතා ප්‍රයෝජනවත් මූලාශයකි. එක් එක් කුරුල්ලන් පිළිබඳ ඔවුන්ගේ සිරුර, සැකිල්ල හා පේශී, අභ්‍යන්තර ඉන්ද්‍රියන්, පක්ෂීන්ගේ සංවේදන, පිහාටු, වර්ණය, කුරුළු බිත්තරය, ඔවුන් ජීවත්වන ප්‍රදේශ යනාදී කරුණු ආවරණය වන ලෙස එක් එක් කුරුල්ලන් පිළිබඳ විස්තර ඉදිරිපත් කොට ඇත. පක්ෂින් වර්ග 350ක පමණ සංඛ්‍යාවකගේ තොරතුරු මෙහි අන්තර්ගත කොට ඇති අතර එක් එක් කුරුල්ලන්ගේ ස්වරූපය, ඔවුන්ගේ හොටය, පිහාටු, පාදය වැනි අංග ලක්ෂණයන් රූපමය මාධ්‍යයෙන් ඉදිරිපත් කර තිබීමද විශේෂත්වයකි. කාණ්ඩ දෙකකින් යුක්තව ඉදිරිපත් කර ඇති මෙම විෂය විශ්වකෝෂයෙහි ලංකාවේ කුරුළු නාමාවලිය, පාරිභාෂික වචන මාලාවක්, එක් එක් වචනවල අර්ථ දැක්වෙන වදන් විවරණයක්ද දක්වා ඇත.

වර්තමානයේ විෂය විශ්වකෝෂ අතර දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ යම්කිසි විෂයකට අයත් අනු මාතෘකා ඔස්සේ ද විශ්වකෝෂ සම්පාදනය වී තිබීමයි. මේවා බොහෝ විට වෙළුම් 3-5 අතර ප්‍රමාණයකට සීමා වී ඇත. මේවා බොහෝවිට සංක්ෂිප්ත විෂය විශ්වකෝෂ ලෙස පෙන්වා දිය හැකිය.

උදාහරණයක් ලෙස සත්ත්ව විද්‍යාව විෂය ගත් විට ලොව සිටින සියලුම සත්ත්වයන් පිළිබඳ තොරතුරු එක් විශ්වකෝෂයක් යටතට ගෙන ප්‍රකාශයට පත් කළ හැකිය. නමුත් එසේ සිදු නොකොට එක් එක් සත්ත්ව විශේෂයන් පිළිබඳ වෙන වෙනම සම්පාදනය කරන ලද විශ්වකෝෂ වර්තමානයේ දැකිය හැකිය. ඉන් කිහිපයක් පහත දැක්වේ.

- Encyclopaedia of Fishes
- Encyclopaedia of Insects
- Encyclopaedia of Birds
- Encyclopaedia of Reptiles

- Encyclopaedia of Amphibia
- Encyclopaedia of Mammals

මේවායෙහි තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ තරමක් දීර්ඝ ලිපියක් වශයෙනි. එය සමහර අවස්ථාවක පොතක පරිච්ඡේදයක ස්වරූපයකින් දැකිය හැක. කෙටි ලිපි වශයෙන් විස්තර දක්වා ඇති අවස්ථාද කලාතුරකින් දැකිය හැක. බොහෝ අවස්ථාවලදී චිත්‍ර හෝ ඡායාරූප අනුසාරයෙන් තොරතුරු වැඩි දුරටත් ඉදිරිපත් කර තිබේ.

**විමර්ශන මූලාශ්‍රයක් ලෙස විශ්වකෝෂයක විශේෂත්වය**

විශ්වකෝෂයක් පිළිබඳව උක්ත නිර්වචනාත්මකව දක්වා ඇති ලක්ෂණ නිසාම එය විමර්ශන මූලාශ්‍රයක් ලෙස ද හඳුන්වනු ලබයි. විමර්ශන ග්‍රන්ථයක් යනු යම්කිසි තොරතුරක් ක්ෂණිකව උද්ධරණය කර ගත හැකි වන සේ තොරතුරු යම් සංවිධානාත්මක ආකාරයකින් ඇතුලත් කොට ඇති ග්‍රන්ථයන් වේ. විශ්ව කෝෂයක මෙම ලක්ෂණය ඉතා මැනවින් දැකිය හැකිය.

විශ්වකෝෂ ග්‍රන්ථයක සඳහන් වන ලිපි අකාරාදී පිළිවෙල අනුව ගොනු කර තිබීම එක් විශේෂත්වයකි. එම තොරතුරුවලට පහසුවෙන් ප්‍රවේශවීම සඳහා අනුක්‍රමණිකාවක් සකස් කර තිබීම විශ්වකෝෂයක දැකිය හැකි තවත් විශේෂත්වයකි. එමඟින් පාඨකයාට අපහසුවකින් තොරව විශාල තොරතුරු ප්‍රමාණයකින් තමාට අවශ්‍යතම තොරතුරු වෙත යොමුවීමට හැකි ලෙස තොරතුරු සංවිධානය කර පෙළ ගස්වා තිබීම විශ්වකෝෂයක දැකිය හැකි සුවිශේෂි ලක්ෂණයකි.

බොහෝ විශ්වකෝෂ ග්‍රන්ථවල යම් යම් විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පුළුල් දැනුමක් පාඨකයාට ලබා දීමට කටයුතු කර තිබෙනු දැකිය හැකිය. එක් එක් විෂයන් හා සම්බන්ධ අනු විෂය මාතෘකා මඟින් ලිපි ඉදිරිපත් කර තිබීමෙන් ඒ ඒ විෂයන් පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීමට පාඨකයාට අවකාශය තිබීම විමර්ශන මූලාශ්‍රයක් ලෙස විශ්වකෝෂයක ඇති තවත් එක් විශේෂත්වයකි.

එසේම විශ්වකෝෂයක තවත් එක් විශේෂත්වයක් වන්නේ එහි ඇති සාධිකාරීත්වය හෙවත් නිවරදි බවයි. එක් එක් විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වෘත්තීයමය සුදුසුකම්වලින් සැදුම්ලත් ලේඛක මඩුල්ලකගේ දායකත්වයෙන් නිමවන මූලාශ්‍රයක් බැවින් එහි ඇති තොරතුරුවල සාධිකාරීත්වයක් දැකිය හැකි වීමද තවත් එක් විශේෂත්වයකි. නිවරදි තොරතුරු රහිත ග්‍රන්ථයක් මඟින් පාඨකයා නොමඟ යාමට ඉඩ කඩ ඇත. වර්තමානයේ තොරතුරක වටිනාකම රදා පවතින්නේ එහි ඇති නිවරදි බව, විශ්වාසනීය බව, කාලීන බව, අදාළ බව හා ප්‍රමාණවත් බව යන සාධක මතය. එබැවින් විශ්ව කෝෂයක්ද මෙකී ලක්ෂණ වලින් අනූන බව කිව යුතුය.

එසේම මේවායෙහි ඇති ලිපිවල දක්වා ඇති විස්තර කිරීම් වලදී පාඨකයාට නිවරදි ලෙස යම් දෙයක් පැහැදිලි කිරීම සඳහා සමහර අවස්ථාවලදී චිත්‍ර හෝ ඡායාරූප භාවිත කරමින් පාඨකයා දැනුවත් කිරීමට කටයුතු කර තිබීම ද විශ්ව කෝෂයක දැකිය හැකි තවත් එක් විශේෂත්වයක් ලෙස පෙන්වා දිය හැකිය.

මේ ආකාරයට අධ්‍යයනයේදී හෝ පර්යේෂණයකදී පාඨකයාට අවශ්‍යය තොරතුරක් සොයා ගැනීමට මෙන්ම ඒ පිළිබඳ ගැඹුරින් හා අර්ථාන්විත පැහැදිලි කිරීමක් දැන ගැනීම සඳහා අන් කවර මූලාශ්‍රයකටත් වඩා විශ්වකෝෂයක් වැදගත් වන්නේ එනිසාය.

**පුස්තකාලයක ප්‍රධානතම විමර්ශන මූලාශ්‍රයක් ලෙස විශ්වකෝෂයක වැදගත්කම**

ඕනෑම පුස්තකාලයක තිබිය යුතු ප්‍රධානතම විමර්ශන මූලාශ්‍රයක් ලෙස විශ්වකෝෂය පෙන්වා දිය හැකිය. පාසැල් පුස්තකාලයක් වුවද, විශ්වවිද්‍යාල පුස්තකාලයක් වුවද, මහජන පුස්තකාලයක් වුවද, විශේෂ පුස්තකාලයක් වුවද, ජාතික පුස්තකාලයක් වුවද මේ සෑම පුස්තකාල වර්ගයකම තිබිය යුතු අත්‍යවශ්‍ය ග්‍රන්ථ විශේෂයක් ලෙස විශ්වකෝෂ පෙරමුණේ සිටී.

විශේෂයෙන්ම විශ්වවිද්‍යාල පුස්තකාලවල අත්‍යවශ්‍ය විමර්ශන මූලාශ්‍රයක් ලෙසද මේවා හැදින්විය හැකිය. විශ්වවිද්‍යාලයක පීඨ ගණනාවක් ඇති අතර ඒ ඒ පීඨ මගින් ක්‍රියාත්මක වන අධ්‍යයන අංශ හරහා විවිධ විෂය පාඨමාලාවන් පවත්වාගෙන යනු ඇත. ආචාර්යවරුන්ගේත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේත් අධ්‍යයන හා පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා විශ්වවිද්‍යාල පුස්තකාලයක තිබිය යුතුම ග්‍රන්ථ විශේෂයක් ලෙස විෂය විශ්වකෝෂ හා සාමාන්‍ය විශ්වකෝෂ පෙන්වා දිය හැකිය.

එසේම විශේෂ පුස්තකාලවලද ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඇති විෂය විශ්වකෝෂ පවත්වාගෙන යාම වැදගත් වේ. විශේෂයෙන්ම පාසැල් පුස්තකාල තුළද යම් ප්‍රමාණයකින් වැදගත්කමින් යුතු පොදු විශ්වකෝෂ විශ්වකෝෂ කිහිපයක් පාඨකයාගේ පරිශීලනයට තැබිය යුතුය. එමෙන්ම බහුවිධ පාඨක ප්‍රජාවක් වෙසෙන මහජන පුස්තකාලයක් තුළද සැලකිය යුතු මට්ටමේ පොදු විශ්වකෝෂ සහ විෂය විශ්වකෝෂ කිහිපයක් තිබීම අනිවාර්යය වේ.

පාඨකයන්ගේ අධ්‍යයන හා පර්යේෂණ කාර්යයේදීත්, ශාස්ත්‍රීය කටයුතුවලදීත් අත්‍යවශ්‍ය මූලාශ්‍ර විශේෂයක් ලෙස විශ්වකෝෂය හඳුන්වා දිය හැකිය. පාසැල් සිසුන් සහ විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යයන කටයුතුවලදීත්, පර්යේෂකයන්ගේ තම පර්යේෂණ ක්ෂේත්‍රයන්හි වැදගත් කාර්යයන් සඳහාත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ශාස්ත්‍රීය කටයුතුවලදීත් විශ්වකෝෂයක ඇති අවශ්‍යතාවය සුළුපටු නොවේ. විශේෂයෙන්ම තෘතියික විමර්ශන මූලාශ්‍රයක් ලෙස මේවායෙහි ඇති තොරතුරුවලින් බැහැරව සිදුකරන ශාස්ත්‍රීය හා පර්යේෂණ කටයුතු පවා සාර්ථක නොවේ.

මේවායෙහි ඇති තොරතුරුවල වටිනාකම හේතුවෙන් බොහොමයක් ග්‍රන්ථවල මිල අධික බවක්ද දැකිය හැක. ඒ නිසාම පාඨකයන් අතින් නැතිවීම හෝ ඒවාට හානි පැමිණවීම අවම කර ගැනීම සඳහාත්, සීමිත පිටපත් සංඛ්‍යාවක් තිබීම නිසාත් මෙම ග්‍රන්ථ පුස්තකාලය තුළම රඳවා තැබීමට පුස්තකාලයාධිපතිවරුන් කටයුතු කරනු ඇත.

තවත් ආකාරයකින් බැලුවහොත් මෙම ග්‍රන්ථ සාහිත්‍ය කෘති මෙන් එක දිගට කියවා ගෙන යාමේ අවශ්‍යතාවයක් නැති පාඨකයා සොයන විෂය කරුණක් හෝ කරුණු කිහිපයක් දැන ගැනීම සඳහා භාවිත කරන ග්‍රන්ථයක් බැවින් මෙම ග්‍රන්ථ පුස්තකාලයේ නිත්‍ය විමර්ශන අංශය තුළ රඳවා තැබිය යුතු විමර්ශන මූලාශ්‍ර විශේෂයක් ලෙස ද සැලකේ.

**අධ්‍යාපන කාර්යයේදී විශ්වකෝෂයෙහි දායකත්වය හා එහි නූතන ප්‍රවණතා**

අධ්‍යාපනික කටයුතුවල නියැලෙන සෑම කෙනෙකුගේම අත්‍යවශ්‍ය තොරතුරු මූලාශ්‍රයක් ලෙස විශ්වකෝෂයට වැදගත් ස්ථානයක් හිමි වේ. ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයේදී මෙම මූලාශ්‍රය භාවිතය අවම වුවද උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලදී විශ්වකෝෂය භාවිතයෙන් තොරව ඥාන ගවේෂණය සිදු කළ නොහැකිය.

විශේෂයෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි නියැලෙන විද්‍යාර්ථීන්ගේ අත්‍යවශ්‍ය මූලාශ්‍ර විශේෂයක් ලෙස විශ්වකෝෂය හැඳින්විය හැකිය. විද්‍යාර්ථීන්ගේ උපාධි නිබන්ධන හා වෙනත් පැවරුම් සඳහා අදාළ තොරතුරු වෙත ප්‍රවේශ වීමේදී තම විෂය මාතෘකාවන්ට අදාළව නිර්වචන හා ඊට අදාළ තොරතුරු සමුදායක් විශ්වකෝෂ මඟින් ලබා දෙනු ඇත. ගවේෂණාත්මකව කරනු ලබන පර්යේෂණයන්හි දීත්, ඊට අදාළ පර්යේෂණ පත්‍රිකා හා ලිපි සම්පාදනයේදීත් විශ්වකෝෂය හැදෑරීම මඟින් පුළුල් දැනුමක් ලබා ගැනීමටත් හැකි වනු ඇත. වඩා ගුණාත්මකභාවයකින් යුතු පර්යේෂණ පත්‍රිකාවක් සම්පාදනයටත්, ශාස්ත්‍රීය නිබන්ධනයක් ඉදිරිපත් කිරීමටත් ඉන් ලැබෙන පිටුවහල අපමණය. විශේෂයෙන්ම විෂය විශ්වකෝෂ තුළින් ලබා දෙන දැනුම් සම්භාරය ශාස්ත්‍රීය අධ්‍යයනයේදී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘජු දායකත්වයක් සපයයි.

වෙළුම් ගණනාවකින් සමන්විත විශ්වකෝෂ බොහොමයක් අද වන විට මාර්ගගතව (Online) පරිශීලනය කිරීමට හැකි වන සේ සකස් කර තිබීම විශ්ව කෝෂකරණයෙහි නූතන ප්‍රවණතාවයක් ලෙස පෙන්වා දිය හැකිය. විශ්වකෝෂයක් පරිශීලනය කරන්නෙකුට වෙළුම් ගණනාවකින් සමන්විත ග්‍රන්ථ පෙරලා බැලීමේ දුෂ්කරතාව මඟ හරිමින් අන්තර්ජාලය ඔස්සේ පහසුවෙන් පරිශිලනයට අවස්ථාව සලසා ඇත.

එසේම තම පුද්ගලික පරිගණකය හරහා CD-ROM සහ DVD භාවිතයෙන් විශ්වකෝෂ පරිශීලනයට අවස්ථාව සලසාදීම නූතනයේ දැකිය හැකි තවත්

විශේෂත්වයකි. උදාහරණයක් ලෙස Microsoft Coparation ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති Encarta Encyclopaedia නම් වූ විශ්වකෝෂ ග්‍රන්ථය digital multimedia encyclopedia ග්‍රන්ථයක් ලෙස පාඨක පරිශීලනයට ඉඩ කඩ සලසා දී ඇත. 17,000 ක් පමණ වූ ලිපි අන්තර්ගත මෙම විශ්වකෝෂයෙහි 2,200 ක් ඉක්මවූ ඡායාරූප, චිත්‍ර, සිතියම්, වගු, ප්‍රස්ථාර යනාදියෙන් ද තොරතුරු ඉදිරිපත් කර ඇත.

එසේම සමහර විශ්වකෝෂ බහු භාෂා ඔස්සේ තොරතුරු ලබාදීම ද නූතනයේ දැකිය හැකි ප්‍රවණතාවයකි. ඉන් ඔබ්බට ගොස් ලිපිවල අන්තර්ගත දැනුම වීඩියෝ දර්ශන හා ශ්‍රවණ මාධ්‍යයෙන්ද, රූපමය ආකාරයෙන්ද විග්‍රහ කර තිබීම සුවිශේෂී ලක්ෂණයකි.

මෙම ලක්ෂණවලින් සමන්විත සාමාන්‍ය විශ්වකෝෂ හා විෂය විශ්වකෝෂ ගණනාවක් දැකිය හැකි වුවද අධ්‍යයන ක්ෂේත්‍රයේ නියැලෙන විද්‍යාර්ථීන්, පර්යේෂකයන් විසින් මේවා පරිශිලනය කරනුයේ අල්ප වශයෙන් බවද කිව යුතුය. පුස්තකාල සේවාවේ හදවත විමර්ශන සේවාවයි යන්න කියමනක් ඇත. එසේනම් විමර්ශන සේවාවේ මුදුන්මල්කඩ විශ්වකෝෂයයි කිවහොත් එය වඩා නිවරදිය. එබැවින් විශ්වකෝෂයක අන්තර්ගත තොරතුරු පිළිබඳ මනා අවබෝධයකින් යුතුව එය පරිහරණය කරන්නේ නම් වඩා ඵලදායි අධ්‍යාපනයකට ඉවහල් වන බව කිව යුතුමය.

### ආශ්‍රිත ග්‍රන්ථ

*ALA glossary of library & information science*. (1983). Chicago: ALA.

Bates, Marcia J., (Ed.). (2010). *Encyclopeadia of library and information science* (3rd ed.). London: Taylor & fancies.

Corea, Ishvari., Ojuando., Gad David, & Faruai, Khalid Kamal (Eds.). (1993). *Encyclopedia of information and library science*, New Delhi: Akashdeep Publication.

*Encyclopedia, The Cambridge Encyclopedia of Language*. (2020). Cambridge University Press. Retrieved from https://dictionary.cambridge.org/dictionary/english/encyclopedia

Jones, Lindsay., (Ed.). (2005). *Encyclopeadia of religion*. (2nd ed.). New york: Gale cengage learning.

Kumar, Krishan. (1987). *Reference services*. New delhi: Vikas publishing house.

Prytherch, Ray., (Comp). (2017). *Harrold's Librarians Glossary*. London: routledge.

Shashi, S.S. (Ed.). (2001). *Encyclopeadia of Indica*. New delhi : Anmol publication.

*The encyclopaedia Americana*. (1990). USA: groliern corporate.

*The encyclopaedia britanica*. (2003). Chicago: encylopeadia britanica incoorated.

ප්‍රේමදර්ශන, විජය (2011). *විමර්ශන පුස්තකාල,* මුල්ලේරියාව : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර (2002). *විශ්ව දැනුමට මග පෙන්වන පුස්තකාල අත්පොත,* කොළඹ : ගුණසේන සමාගම.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර (2005). *පුස්තකාලය හා විශ්ව දැනුම,* කොළඹ : ගොඩගේ ප්‍රකාශක.

විජේසුන්දර, මංජුල (2007). *සිංහල කුරුළු විශ්වකෝෂය.* කොළඹ : සූරිය ප්‍රකාශක.